දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 23/16

බ13/4/අක්මුදල්

අත්තිකාරම් ගිණුම් අංශය

බන්ධනාගාර මූලස්ථානය.

2016/10/03

සියලුම බන්ධනාගාර අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් වෙත,

**අත්තිකාරම් බී ගිණුමේ ආපදා ණය ගෙවීම.**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම බී ගිණුමට අදාලව ආපදා ණය ගෙවීම සම්බන්ධයෙන් 2016/09/30 දින පැවති මාණ්ඩලික නිළධාරී රැස්වීමේ සාකච්ඡා කර ගත් තීරණය පරිදි එම අත්තිකාරම් ගෙවීම පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

මෙතෙක් ආපදා ණය ගෙවීමට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිකුත්කර තිබූ අංක 2013/14 හා 2013/03/15 දිනැති චක්‍රලේඛය බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක 22/2015 හා 2015/09/12 දිනැති දෙපාර්තමේන්තු චක්‍රේල්ඛයෙන් අවලංගු කරන ලදී.එබැවින් මින් ඉදිරියට ආපදා ණය ගෙවීම භාණ්ඩාගාරයේ චක්‍රලේඛ අංක 118 හා 2004/10/11 දිනැති අයවැය චක්‍රලේඛයේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන , මුදල් රෙගුලාසි ,රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුව ප්‍රාදේශීය බන්ධනාගාර වල නඩත්තු කරනු ලබන ප්‍රමුඛතා ලේඛණය පදනම් කර ගෙන ගෙවීම සිදු කළ යුතුය.එහිදී බන්ධනාගාර අධිකාරී විසින් නියමිත නීතිරීති රෙගුලාසි ,චක්‍රලේඛ විධිවිධාන උල්ලංගණය නොවන සේ බන්ධනාගාර වෙත වෙන් කර දෙන ප්‍රතිපාදන හා අක්මුදල් භාවිතා කර නිලධාරින් වෙත ආපදා ණය ගෙවීම සිදු කළ යුතුය.

බන්ධනාගාර මූලස්ථානයේ ගිණුම් හා මූල්‍ය අංශය විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් තුළ ලැබෙන අක්මුදල් බන්ධනාගාර ආයතනවල ණය ඉල්ලුම් කරන නිලධාරින්ගේ අනුපාතය අනුව අක්මුදල් හා ප්‍රතිපාදන බන්ධනාගාර අධිකාරිවරුන් වෙත නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. බන්ධනාගාර අධිකාරිවරුන් විසින් එම ප්‍රතිපාදන හා අක්මුදල් භාවිතා කර ගෙවීම් කළ පසු ගෙවන ලද නිලධාරින්ගේ විස්තර ලේඛණයක් සකස් කර කොමසාරිස් ( මුදල් ) වෙත එවිය යුතුය. එම ගෙවීම් විස්තරය මාසික ගිණුම් සාරාංශයේ තොරතුරුවලට සමාන විය යුතු අතර බන්ධනාගාර අධිකාරී වෙත නිදහස් කරනු ලබන ප්‍රතිපාදන හා අක්මුදල් එම මාසය තුළ ගෙවා අවසන් කිරීමට බන්ධනාගාර අධිකාරිවරුන් ක්‍රියා කළ යුතුය.

එබැවින් මෙම ලිපියේ උපදෙස් අනුව විධිමත් පොරොත්තු ලේඛණ නඩත්තු කර ගෙවීම් කටයුතු සංවිධානය කර ගැනීමට සියලුම බන්ධනාගාරවල අධිකාරිවරුන් වෙත මෙයින් කාරුණිකව උපදෙස් දෙමි.

.......................................................

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,
බන්ධනාගාර මූලස්ථානය.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

පිටපත් - බන්ධනාගාර කොමසාරිස් ( පාලන )
බන්ධනාගාර කොමසාරිස් ( අභ්‍යන්තර විගණක )